දුරකථන/தொலைபேசி இல./Telephone Nos.
අමාත්‍යතුමා / அமைச்சர் / Minister: 2784832, 2784807, 2785617
ලේකම් / செயலாளர் / Secretary: 2784812
කාර්යාලය / அலுவலகம் / Office: 2785141-50, Fax: 2784846
ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

ඔබේ අංකය / உமது இல. / Your No. ........................................

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education
'ඉසුරුපාය'
බත්තරමුල්ල.
"இசுருபாயா"
பத்தரமுல்ல.
"Isurupaya"
Battaramulla.

මගේ අංකය / எமது இல. / My No. ඊඩී/2/29/2/ව/පොදු

දිනය / திகதி / Date 2011.11.11

**චක්‍රලේඛ අංකඃ 2011/ 30**

සියලුම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සහා ලේකම්වරුන් වෙත.

## <u>ශ්‍රී ලංකා ගුරු සේවයේ උසස්වීම්</u>

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ 1995.04.03 දිනැති 865/03 අංකිත අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහය අවස්ථා කිහිපයකදී සංශෝධනයට ලක්ව ඇති අතර එසේ සංශෝධිත ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයට අනුකූලව එක් පන්තියක / ශ්‍රේණියක සිට ඊට ඉහළ පන්තියට / ශ්‍රේණියට උසස්වීම් ලබා ගැනීම සඳහා ප්‍රමාණවත් අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් ලබා සිටින හා අවශ්‍ය ලකුණු උපයාගෙන සිටින ගුරුවරයෙකු විසින් සපුරා ගත යුතු අවශ්‍යතා පහත දක්වා ඇත.

(i) සේවාස්ථ පුහුණු වැඩ සටහන් සඳහා සහභාගීත්වය

(ii) වෘත්තීය සමාලෝචනය සමත්වීම

(iii) කඩඉම් විභාගය සමත් වීම

(iv) නම් කළ පාසලක නිශ්චිත සේවා කාලයක් තිබීම

02. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ ES/2/2/8 අංකිත හා 2011.09.20 දිනැති ලිපියෙන් ගුරුවරුන්ගේ උසස්වීම්වලට අදාළව ඉහත සඳහන් පූර්ව අවශ්‍යතාවයන්ගෙන් නිදහස් කිරීමට අනුමැතිය ලබා දී ඇති අතර, එකී නිදහස් කිරීම් යටතේ 2010.12.31 දින දක්වා පමණක් පහත දක්වා ඇති පරිදි මෙම සහනයන් ක්‍රියාත්මක කර අදාළ උසස්වීම් ලබා දීමට කටයුතු කරන ලෙස දන්වමි. මගේ අංකඃ 2009/25 හා 2009.08.12 දිනැති චක්‍රලේඛය මගින් පෙර සඳහන් අවශ්‍යතා විවිධ නියමයන්ට යටත්ව 2008.12.31 දින දක්වා නිදහස් කොට තිබුණි. ඒ අනුව මෙම චක්‍රලේඛය පරිදි ගුරුභවතුන්ට උසස්වීම් ලබා දිය යුතු දිනය 2009.01.01 දින හෝ ඊට පසු දිනයක් විය යුතු අතර, 2010.12.31 දින හෝ ඊට පෙර දිනයක් විය යුතුය.

## 3 - II න් 3 - I පන්තියට

ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 වන පන්තියේ II වන ශ්‍රේණියේ සිටින ගුරු පුහුණු සහතිකයක්/විධිමත් නිවාවූ ලැබ. නිර්නිත විෂය ක්ෂේත්‍රවලට අදාළව ලබා ගත් අභ්‍යන්තර උපාධියක් / නිර්නිත විෂය ක්ෂේත්‍රවලට අදාළව ලබා ගත් බාහිර උපාධියක් හෝ ඒ හා සමාන සුදුසුකමක් උපයා නොගත් නුපුහුණු ගුරුවරයෙකු වේ නම් එම නුපුහුණු ගුරු භවතාගේ සක්‍රිය හා සතුටුදායක නුපුහුණු ගුරු සේවා කාලය වර්ෂ 10 සපිරෙන දිනය හෝ 2009.01.01 යන දින දෙකෙන් පසුව එළඹෙන දින සිට සේවාස්ථ පුහුණු අවශ්‍යතාව නොසලකා ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 වන පන්තියේ I වන ශ්‍රේණියට උසස් කිරීම.

## 3 - I න් 2 - II ට උසස් කිරීම

(i) ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 වන පන්තියේ I වන ශ්‍රේණියේ සිටින පුහුණු, පුහුණු ඩිප්ලෝමාධාරීන් සහ ඒ හා සමාන සුදුසුකම් ලත් බවට පිළිගනු ලබන ගුරු භවතුන් 3 වන පන්තියේ සේවා කාලය තුළ උපයාගත් ලකුණු 05 ක් ලැබූ දිනය හෝ 2009.01.01 යන දින දෙකෙන් පසුව එළඹෙන දින සිට සේවාස්ථ පුහුණුව සඳහා සහභාගීත්වය හා නම් කළ පාසලක නිශ්චිත සේවා කාලය යන අවශ්‍යතා නොසලකා ශ්‍රී ලංකා ගුරු සේවයේ 2 වන පන්තියේ II වන ශ්‍රේණියට උසස් කිරීම.

(ii) ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 වන පන්තියේ I වන ශ්‍රේණියේ සිටින වෘත්තීය සුදුසුකම් රහිත උපාධිධාරීන් සහ ඒ හා සමාන සුදුසුකම් ලත් බවට පිළිගනු ලබන ගුරු භවතුන් 3 වන පන්තියේ සේවා කාලය තුළ උපයාගත් ලකුණු 05 ක් ලැබූ දිනය හෝ 2009.01.01 යන දින දෙකෙන් පසුව එළඹෙන දින සිට නම් කළ පාසලක නිශ්චිත සේවා කාලය යන අවශ්‍යතාවය නොසලකා ශ්‍රී ලංකා ගුරු සේවයේ 2 වන පන්තියේ II වන ශ්‍රේණියට උසස් කිරීම.

(iii) ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 වන පන්තියේ I වන ශ්‍රේණියේ සිටින වෘත්තීය සුදුසුකම් රහිත උපාධිධාරීන් සහ ඒ හා සමාන සුදුසුකම් ලත් බවට පිළිගනු ලබන ගුරු භවතුන් පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාවක් ලබා එම ඩිප්ලෝමාව වලංගු වන දිනය හෝ 2009.01.01 යන දින දෙකෙන් පසුව එළඹෙන දින සිට නම් කළ පාසලක නිශ්චිත සේවා කාලය යන අවශ්‍යතාවය නොසලකා ශ්‍රී ලංකා ගුරු සේවයේ 2 වන පන්තියේ II වන ශ්‍රේණියට උසස් කිරීම.

**2 - II න් 2 - I ට උසස් කිරීම**

(i) ශ්‍රී ලංකා ගුරු සේවයේ 2 වන පන්තියේ II වන ශ්‍රේණියේ සිටින පුහුණු, පුහුණු ඩිප්ලෝමාධාරීන් සහ ඒ හා සමාන සුදුසුකම් ලත් බවට පිළිගනු ලබන ගුරු භවතුන් අතුරින් 2 වන පන්තියේ II වන ශ්‍රේණියේදී ලකුණු 10 ක් උපයා ගත් ගුරු භවතුන්, සේවාස්ථ පුහුණු සහභාගීත්වය, වෘත්තීය සමාලෝචනය සමත්වීම සහ නම් කළ පාසලක නිශ්චිත සේවා කාලයක් සේවය කිරීම යන අවශ්‍යතා නොසලකා ඉහත ලකුණු 10 උපයා ගත් දිනය හෝ 2009.01.01 යන දින දෙකෙන් පසුව එළඹෙන දින සිට ශ්‍රී ලංකා ගුරු සේවයේ 2 වන පන්තියේ I වන ශ්‍රේණියට උසස් කිරීම.

(ii) ශ්‍රී ලංකා ගුරු සේවයේ 2 වන පන්තියේ II වන ශ්‍රේණියේ සිටින වෘත්තීය සුදුසුකම් සහිත උපාධිධාරීන් සහ ඒ හා සමාන සුදුසුකම් ලත් බවට පිළිගනු ලබන ගුරු භවතුන් අතුරින් 2 වන පන්තියේ II වන ශ්‍රේණියේදී ලකුණු 10 ක් උපයා ගත් ගුරු භවතුන්, සේවාස්ථ පුහුණු සහභාගීත්වය, වෘත්තීය සමාලෝචනය සමත්වීම සහ නම් කළ පාසලක නිශ්චිත සේවා කාලයක් සේවය කිරීම යන අවශ්‍යතා නොසලකා ඉහත ලකුණු 10 උපයා ගත් දිනය හෝ 2009.01.01 යන දින දෙකෙන් පසුව එළඹෙන දින සිට ශ්‍රී ලංකා ගුරු සේවයේ 2 වන පන්තියේ I වන ශ්‍රේණියට උසස් කිරීම.

**1 වන පන්තියට උසස් කිරීම**

ශ්‍රී ලංකා ගුරු සේවයේ 2 වන පන්තියේ I වන ශ්‍රේණියේ සිටින පුහුණු, පුහුණු ඩිප්ලෝමාධාරීන් හා වෘත්තීය සුදුසුකම් සහිත උපාධිධාරීන් සහ ඒ හා සමාන සුදුසුකම් ලත් බවට පිළිගනු ලබන ගුරු භවතුන් අතුරින් 2 වන පන්තියේ I වන ශ්‍රේණියේ සේවා කාලය තුළ ලකුණු 05 ක් උපයා ගත් ගුරු භවතුන්, සේවාස්ථ පුහුණු සහභාගීත්වය, වෘත්තීය සමාලෝචනය සමත්වීම සහ කඩ ඉම් විභාගය සමත් වීම යන අවශ්‍යතා නොසලකා ඉහත ලකුණු 05 උපයා ගත් දිනය හෝ 2009.01.01 යන දින දෙකෙන් පසුව එළඹෙන දින සිට ශ්‍රී ලංකා ගුරු සේවයේ 1 වන පන්තියට උසස් කිරීම.

04. ශ්‍රී ලංකා පරිවේණාචාර්ය සේවය හා ශ්‍රී ලංකා පෞද්ගලික පාසල් ගුරු සේවය ශ්‍රී ලංකා ගුරු සේවයට සමාන හා සමාන්තර සේවා වන හෙයින් මෙම චක්‍රලේඛයේ දක්වා ඇති විධිවිධාන එම සේවාවලටද අදාළ කොට ගෙන පරිවේණාචාර්යවරුන් සඳහා සහ පෞද්ගලික පාසල් ගුරුවරුන් සඳහා අදාළ වන පරිදි උසස්වීම් ලබා දීමට කටයුතු කළ යුතුය. එසේම මෙම කාලයේදී විශ්‍රාම ලැබූ ගුරු භවතුන්ටද මෙම චක්‍රලේඛයේ විධිවිධාන අදාළ කර ගත යුතුය.

05. ඉහත උසස්වීම් සිදු කිරීමෙන් අනතුරුව වැටුප් සකස් කළ යුත්තේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 11/94 සහ 7/2000 මගින් සංශෝධිත ආයතන සංග්‍රහයේ VII වන පරිච්ඡේදයේ 5 වන වගන්තිය අනුවය.

06. ඉහත දැක්වෙන උපදෙස් පරිදි ශ්‍රී ලංකා ගුරු සේවයේ උසස්වීම් ලැබීමට හිමිකම් ඇති සියලුම ගුරු භවතුන්ට උසස්වීම් ලබා දීම සඳහා අවශ්‍ය කටයුතු සලස්වන ලෙස දන්වමි.

එච්.එම්. ගුණසේකර
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත්:-

(1) ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව - දැ.ගැ.ස.

(2) පළාත් ප්‍රධාන ලේකම්වරුන් - දැ.ගැ.ස. සහ අ.ක.ස.

(3) පළාත් අධ්‍යාපන ලේකම්වරුන් - පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් මත අ.ක.ස.

(4) පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් - දැ.ගැ.ස. සහ අ.ක.ස.

(5) කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් - දැ.ගැ.ස. සහ අ.ක.ස.

(6) කොට්ඨාශ භාර නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් - දැ.ගැ.ස. සහ අ.ක.ස.